## අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

# බලු-මිනිසා සහ මිනිස්-බල්ලා

මේ කතාව කියවන ඔබ එය එක්වරම විශ්වාස නොකරන්නට ඉඩ ඇත. මගෙන් ප්‍රශ්න රැසක් අසන්නට ඉඩ ඇත. ඒ අවසානයේ වුවද, ඔබේ සිතේ ඇති කුකුස මුළුමනින් ම නැති කරන්නට මට හැකි නොවන්නට ද ඉඩ ඇත.

එසේ වුවොත් එය සමාව දිය හැකි කරුණකි. ඒ කුමක් නිසා ද යත්, වෙනෙකෙකු තමන් ගැන මට මේ කතාව අද කීවොත්, මා ද එය විශ්වාස කරන්නට පෙර ඒ ගැන ප්‍රශ්න කරන්නට බොහෝ දුරට ඉඩ ඇති නිසා ය.

මේ සිදුවීම මා ප්‍රාථමික පාසලේ පළමුවෙනි ශ්‍රේණියේ ඉගෙන ගත් කාලයේ සිදු වූ මා හා සම්බන්ධ එකකි. එනම්, මට ම අයිති මගේ ම අත්දැකීමකි. මේ කතාව පිළිබඳව මට මෙන්ම ඔබට ද අවිශ්වාසය ඇති කරන එකම කාරණය නම්, එකල මා වයස අවුරුදු හයකට අඩු කුඩා ළමයෙකු වීමයි.

අපේ පන්තිය භාර ගුරුවරිය වූයේ ප්‍රඥාවතී ටීචර් ය. ඇගේ රුව මගේ සිහියේ රැඳී ඇත්තේ සුදු මිශ්‍ර ඔසරියකින් සැරසුණු, අඩකට වඩා සුදු පැහැගත් හිසකින් යුතු විශ්‍රාම වයසේ කාන්තාවක ලෙසයි. එයට හේතුව ප්‍රඥාවතී ටීචර්ව මා මෙයින් වසර පහළොවකට පමණ පසුව ද දැක තිබීම විය හැකිය. මේ කාලයේ ඇය වයස අවුරුදු හතළිස් පහකට වැඩි නොවන්නට ඇතැයි වෙනත් කරුණු මත අනුමාන කරමි.

අමුතු කරුණාවන්ත කමක් අපට පෙන්වූ බවක් මගේ මතකයේ නැති වුවද, ප්‍රඥාවතී ටීචර් නපුරු ගුරුවරියක ලෙස මම වර්ග නො කරමි. එසේ වෙතත්, ඇගේ පන්තියේ උගත් සිසුන් වූ අප නම්, ඒ වසරේ ජනවාරියේ දී පාසල් අධ්‍යාපනය ඇරඹූ, එනම් වයස යාන්තම් අවුරුදු පහ පිරුණු, ඕනෑම අයෙකුගේ සිත මොළොක් කරවන සුරතල් ළමුන් පිරිසක් යැයි සිතීමට මම කැමැත්තෙමි. පළමුවෙනි ශ්‍රේණියේ ළමුන්ට නපුරුකම් කරන ගුරුවරියක කිසිදා සිටී යැයි මට නොසිතේ.

එසේ නමුත්, ප්‍රඥාවතී ටීචර් එක්තරා දිනයක, එක්තරා සුවිශේෂී අවස්ථාවක, අපේ පන්තියේ එක්තරා ගැහැණු ළමයෙකුට තර්ජනාත්මක විලාසයෙන් කියූ එක්තරා නපුරු කතාවක් නිසා මගේ හිත තදින් තිගැස්සුණි.

ඒ ගැන මගේ විරෝධය ඇයට පෙන්වීමට මට අවශ්‍ය වී ය.

නමුත් අවුරුදු පහමාරක දරුවෙකු එවැන්නක් කෙසේ නම් කරන්නද?

සම වයසේ අයෙකුට හෝ බාලයෙකුට හෝ නම් ටොක්කක් අනින්නට හෝ කොනිත්තන්නට හෝ පහරක් ගහන්නට හෝ අඩු වශයෙන් බනින්නට හෝ හැකිය.

නමුත් වැඩිහිටියෙකුට?

ඔබේ පන්තිය භාර ගුරුවරිය ට?

මා මුහුණ දුන් තත්වය ඔබට තවත් විස්තර කළ යුතු නැති යැයි සිතමි.

ඉතින් මා එදා කළේ මෙයයි.

අප එකල පාසලේ දී භාවිතා කළේ ගල්ලෑලි සහ ගල්කුරයි. පැන්සල සහ අභ්‍යාස පොත් භාවිතයට අපට අවසර ලැබුණේ තුන්වෙනි ශ්‍රේණියේ දී ය.
මම ගල්ලෑල්ලේ එක පැත්තක ගල්කූරෙන් චිත්‍රයක් ඇන්දෙමි.

ඒ බලු හිසක් සහිත මිනිසෙකි. ඒ චිත්‍රයේ අද මගේ ප්‍රතිනිර්මාණ මෙහි දක්වා ඇත.




ගල්ලෑල්ලේ අනිත් පැත්තේ මම වෙනත් චිත්‍රයක් ඇන්දෙමි.




ඒ මිනිස් හිසක් සහිත බල්ලෙකි. ඒ දෙවෙනි චිත්‍රයේ අද මගේ ප්‍රතිනිර්මාණය ද මෙහි දක්වා ඇත.

පන්තියේ ඉදිරිපසට ගොස් ඒ චිත්‍ර දෙක ප්‍රඥාවතී ටීචර් ට පෙන්වූයෙමි.

ඇය තරමක හෝ විස්මයට පත් වෙන්නට ඇත.
නමුත්, ඇය කිසිදු ප්‍රශ්නයක් නො නගා ගල්ලෑල්ලේ ඇඳි සිතුවම් දෙකට විශාල හරි ලකුණු දෙකකින් සංග්‍රහ කළා ය.

මා ඒ චිත්‍ර යුගල නිර්මාණය කර ඇයට පෙන්වන්නේ, පෙර කී ඇගේ අනිසි වදන් පෙළ ගැන මගේ ඇති විරෝධය දැක්වීම බව ඇය කිසිසේත් ම දැන නො ගන්නට ඇත.

මම ද, ඒ ගැන කිසිත් නො කියා ආපසු පැමිණ පන්තියේ දෙවෙනි පේළියේ මගේ පුටුවේ වාඩි වුණෙමි.

මගේ චිත්‍ර යුගල, අඩුතරමින් මා අසල අසුන්වල සිටි රාජිකා පොද්දල්ගොඩට හෝ ආනන්ද ජයතිලකට හෝ පෙන්වූවාදයි මට මතක නැත.
ගල්ලෑල්ලක ගල්කූරකින් ඇඳි අකුරු හෝ සිතුවම් හෝ පසුව අත්විඳින අනිවාර්ය ඉරණම, මගේ ඒ විරෝධතා සිතුවම් යුගලයට ද එදින පාසල නිමා වෙන්නට පෙර හිමි විය.

ඒ නිර්මාණ දශක හතරකටත් වඩා වැඩි කාලයක් දිගටම ඇඳී තිබුණේ මගේ හිතේ පමණි.

මේ කතාව වෙනකෙකු කියනවා මා ඇසුවොත් මට එය විශ්වාස කරන්නට අසීරු වන්නේ, මා කලින් ඉඟි කළ පරිදි, මේ විරෝධය දැක්වූයේ වයස අවුරුදු පහක නොමේරූ ළමයෙකු වීම නිසා ය.
මා ඒ කරන්නේ විරෝධය පෑමක් බව, ප්‍රඥාවතී ටීචර් දැන නොගන්නට ඇත්තේ ද ඒ නිසා ය.
ඇය මින් වසර කිහිපයකට පෙර වයස්ගතව මිය ගියේ මගේ විරෝධය පිළිබඳව කිසිදු අදහසක් නොමැතිව බව හැඟෙන විට නම් මට අද ඇති වෙන්නේ තරමක දුකකි.

# පෙරළූ නැවුම් පස



මනුෂ්‍ය වර්ගයාගේ බුද්ධියට හා හදවතට බලපෑම් කිරීමට සමත් විශිෂ්ඨ හැකියාවක් කලාව සතුව ඇත්තේය. මා අවංකවම අදහන අයුරින් යමෙකුට තමා කලාකරුවෙකු ලෙසින් හඳුන්වා ගැනීමේ පූර්ණ අයිතිය ඇත්තේ ඔහු මෙම ශක්තිය මිනිසුන්ගේ හදවත් තුල අලංකාර ලෝකයක් නිර්මාණය කිරීම උදෙසා යොදවන්නේ නම් හා ඔහු මනුෂ්‍ය වර්ගයා වෙත කැඳවන්නේ නම් පමණි.

මගේ කෘති මානව වර්ගයාගේ සිත් සතන් වඩ වඩාත් නිර්මල කිරීමට වඩා යහපත් කිරීමට මිනිසාට මග පෙන්වීමට ඉවහල් වන්නේ නම් මම ඒ පිළිබඳව උදක්ම සතුටු වෙමි.

**පෙරළූ නැවුම් පස ලියූ ..මිහායිල් ශෝලොහොව් 1965 නොබෙල් ත්‍යාගය පිළිගනිමින් කල කතාවෙන් ...**

**චූලක බණ්ඩාරවත්ත**

Alpha academy
Classes at Dandenong
Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program

| | |
|---|---|
| Primary & Secondary | - Mathematics, Science and English |
| VCE | - Biology, Chemistry |
| VCE English | - Recommended Texts Analytical Writing |

Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093